# කො/දේවි බාලිකා විද්‍යාලය

## පළමු වාර පරීක්ෂණය - 2014

## සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය | කාලය පැය 1 1/2

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. ඝඤ්ඤක අක්ෂර දෙකක් භාවිත කර වචන දෙකක් ලියන්න.

02. මහාප්‍රාණ අක්ෂර දෙකක් යෙදන වචන දෙකක් ලියන්න.

03. ස , ෂ යන අකුරු දෙකට කියන නම් ලියන්න.

04. ගැටය සහිත ඇලපිල්ල යොදා වචනයක් ලියන්න.

05. කොම්බු දෙක යෙදුන වචනයක් යොදා කෙටි අර්ථවත් වාක්‍යයක් ලියන්න.

06. ඌ , මම , ඇය යන පද අයත් නාම වර්ගය නම් කරන්න.

07. පූර්ව ක්‍රියාවක් යෙදුන වාක්‍යයක් ලියන්න.

08. මුල් පදයට විරුද්ධාර්ථයක් දෙන යුගල පදයක් ලියන්න.

09. පහත වාක්‍ය ලියන බසට හරවන්න.
කුමරිය පාන්දර පොතක් කියෙව්වා.

10. පහත වාක්‍යයේ විරාම ලක්ෂණ යොදන්න.

මෙච්චර වටිනා රන්තලියක් වෙලත් බැරි ද මට වළලු කුට්ටමක් ලබා ගන්න.

11. පහත වචනවල අනුක්ත පද ලියන්න.
කාන්තාව , මිනිසෙක් , දැරියක් , මොනරෙක්

12. නොගැලපෙන පදය තෝරන්න.
හිරු , රවි , උළිඳු , දිවාකර , දිනියුරු

13. නිවැරදි අක්ෂර විනාසය සහිත පදය තෝරන්න.
කණිෂ්ඨ , පාඨසාලාව , ප්‍රතිඵල , විශිෂ්ඨ

14. "ගින්දර" යන්නට සමාන පදයක් ලියන්න.

15. "ආයුධ" යන්නට විරුද්ධ පදය ලියන්න.

16. "පාද කිසිත්ම නැති" යන්නට ගැලපෙන තනි පදය ලියන්න.

17. පහත පිරුළ සම්පූර්ණ කරන්න.
.................................. ගලේ ගැහුවා වගෙයි.

පහත වාක්‍ය වල හිස්තැන් පුරවන්න.

18. ඔබ දිනපතා පාසලට ..................................................

19. තුරුපෙළ වනය අලංකාර ..................................................

20. තෙරණුවෝ ධර්මය දේශනා ..................................................

(ලකුණු 20)

## 2 - කොටස

01) පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. "අලියෙක් ඉන්නවා. කවුරුත් නිශ්ශබ්ද වෙන්න."

   ආ) මේ ප්‍රකාශය කළේ කවුද ?

   ආ) මේ ප්‍රකාශය ඇති පාඩම කුමක්ද ?

   ඇ) මේ අය නැරඹීමට ගියේ කොහේද ?

   ඈ) ගමනට සහභාගී වූ මිතුරියන්ගේ නම් මොනවාද ?

2. වැඩ කරන්නට බැරි වූ දාට ඔහුට මොනවා වෙයි ද ?

   අ) මේ ප්‍රකාශය කළේ කවුද ?

   ආ) කවුරුන් හට ප්‍රකාශ කළේද ?

   ඇ) මේ පාඩම උපුටාගත් ග්‍රන්ථය කුමක්ද ?

   ඈ) එය රචනා කළේ කවුද ?

3. "එසේ හෙයින් දැන් මොහු යා නොදෙමි"

   අ) මේ ප්‍රකාශය සිතුවේ කවුද ?

   ආ) එසේ සිතීමට හේතුව කුමක්ද ? (කෙටියෙන් ලියන්න)

   ඇ) මේ ප්‍රකාශය අයත් පාඩම උපුටාගත් කතාව කුමක්ද ?

   ඈ) පාඩමේ නම කුමක්ද ?

4. "මගේ විශ්වවිද්‍යාලය මහජන පුස්තකාලයයි"

   අ) මේ ප්‍රකාශය කළ පුද්ගලයාගේ සම්පූර්ණ නම ලියන්න.

   ආ) එය උපුටාගත් පාඩමේ නම කුමක්ද ?

   ඇ) මෙතුමාගේ ළමා කෘති දෙකක නම් ලියන්න.

5. "අපි දුප්පත් මිනිස්සු. අපට වෙලාවක් නෑ සෙල්ලම් කර කර ඉන්න."

අ) මෙය ප්‍රකාශ කළේ කවුද ?

ආ) ප්‍රකාශ කළේ කාටද ?

ඇ) මේ පාඩමේ සිටි අනෙක් චරිත දෙක කවුද ?

ඈ) මෙය නිර්මාණය කළේ කවුද ?

(ලකුණු 20)

(02) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

එහෙ මෙහෙ දුවලා මැටිත් ගෙනල්ලා
උසින් උසට මහ ලොකු ගේ හදලා
මේ හැටි මොකටද මහ ලොකු මන්දිර
දහස් ගණන් වත් ඇත්දෝ පවුලක
මහ ලොකු පුදුමෙකි ලොකුම තෑග්ගකි
වෙහෙසව හැදුගේ දෙනවා නයෙකුට

1. මේ කවියෙන් ප්‍රකාශවන්නේ කවුරුන් ගැන ද ?
2. තෑග්ගක් ලෙස දෙන්නේ කුමක්ද ?
3. මහන්සි වී හැදූ ගෙයට කියන නම ඔබේ මතකයෙන් ලියන්න.
4. මන්දිරය සාදන්නේ මොනවා යොදාගෙනද ?
5. මන්දිර, ලොකු යන පදවලට සමාන පද ලියන්න.

The National e-learning Portal for The General Education

(ලකුණු 10)